# 2557 - මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2013

**4 ශ්‍රේණිය** **(08) සමාජ විද්‍යාව** **පැ තුනයි**

* I කොටසේ ප්‍රශ්න සියල්ලටත්, II කොටසින් තෝරාගත් ප්‍රශ්න **හතරකටත්** පිළිතුරු ලියන්න.

## I කොටස

**01. කෙටි පිළිතුරු සපයන්න.**

i. 19 වන සියවසට පෙර විසූ දාර්ශණිකයින් දෙදෙනෙකු නම් කරන්න.

ii. සමාජ විද්‍යාවේ සංවර්ධනයට දායක වූ සමාජ විද්‍යාඥයින් දෙදෙනෙකු නම් කරන්න.

iii. පරිණාමවාදයට අනුව සමාජය අධ්‍යනය කළ සමාජ විද්‍යාඥයා කවුරුන්ද?

iv. සමාජ විද්‍යාව අධ්‍යයනය කරනු ලබන සංකල්ප දෙකක් ලියන්න.

v. ආර්ථික සාධකය පදනම් කරගත් සමාජයක් බිහි කිරීමට උත්සුක වූ සමාජ විද්‍යාඥයා කවුද?

vi. රෝම අධිරාජ්‍යයේ විසූ බලවත් පාලකයා නම් කරන්න.

vii. සමාජයක පවතින පොදු අවශ්‍යතා හතරක් ලියන්න

viii. 17 වැනි සියවසේ මහනුවර රාජධානියේ දී සිරගත වූ ඉංග්‍රීසි ජාතිකයා කවුද?

ix. ලිඛිත ව්‍යවස්ථාවකට අනුව ශ්‍රී ලංකාව ප්‍රථම වරට හඳුන්වා දුන් පාලන ක්‍රමය කුමක් ද?

x. ලෝකයේ පවතින පාලන ක්‍රම දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 4x10 = 40)

## II කොටස

02. සමාජ විද්‍යාව බිහි වූ ආකාරය පැහැදිලි කරන්න.

03. පැරණි හා නූතන සමාජයන්හි ලක්ෂණ තුලනය කරන්න.

04. පෙරදිග ශිෂ්ටාචාර ව්‍යාප්තිය පිළිබඳ සාකච්ඡා කරන්න.

05. 'පුද්ගල ජීවිතයේ දී සමාජ අවශ්‍යතා වැදගත්වේ'. විමසන්න.

06. ලෝකයේ පවතින පාලන ක්‍රම පිළිබඳව විස්තරයක් ලියන්න.

07. බෞද්ධ ඉගැන්වීම ශ්‍රී ලාංකික සංස්කෘතිය කෙරෙහි බලපෑ අයුරු විමර්ශනය කරන්න.

08. ශ්‍රී ලංකා සමාජය බටහිර කරණයට නතු වීම තුළින් ඇති වූ සමාජ වෙනස්වීම් පැහැදිලි කරන්න.

(ලකුණු 15x4 = 60)